# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2017 අගෝස්තු මස 28 වන දින (සඳුදා) පෙ.ව. 10.00 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපිලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම.

IV. පෙත්සම්

V. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VI. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VII. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට,

යෝජනාව :

"අද දින සභා රැස්වීමේ වැඩ කටයුතු, පොදු කටයුතු විෂයය සඳහා පමණක් සීමා විය යුතු අතර, එම වැඩ කටයුතු සඳහා රීති අංක 15(4), 57(1), 57(3), 57(4) හා 57(5) හි විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."

## VIII. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරුසේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප);

යෝජනාව:

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය"

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත'

(විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - පනත් කෙටුම්පත )

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154 උ 2** අනු ව්‍යවස්ථාව අනුව මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කරනු පිණිස, අතිගරු ජනාධිපතිතුමන් විසින් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත එවන ලදුව, ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පළාත් සභාව වෙත යොමු කරන ලද "*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය*"-"*ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ පනත් කෙටුම්පත*"-*(විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය - පනත් කෙටුම්පත)* පිළිබඳව, **2017-08-22** දින පැවැති මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ දී එළඹුණු සම්මුතීන්ට අනුකූලව, එම පනත් කෙටුම්පත සම්බන්ධව මෙම පළාත් සභාවේදී සාකච්ඡා කර එළඹෙන තීරණයන්ට අනුකූලව පළාත් සභාවේ අදහස් පිළිබඳ ප්‍රකාශනයන් අතිගරු ජනාධිපතිතුමන් වෙත වාර්තා කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට ක්‍රියා කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."

## IX. සභාව කල් තැබීම.

2017.08.22 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව